# ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය - 2010

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

මෙම වාර්තාවේ ඇතුලත් අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති.

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කර නොතිබුණි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 42 ප්‍රකාරව පාරිතෝෂික අරමුදල් ආයෝජනය කිරීම් හා ආයෝජන ප්‍රතිලාභ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීම හා පාරිතෝෂික ගෙවීම් සඳහා පැන නගින අනාගත බැරකම් පියවීමට අරමුදලක් ගොඩනැගීම කළයුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. භාණ්ඩාගාර ප්‍රතිපාදන නොලැබෙන බැවින් අරමුදලක් ගොඩනැගිය නොහැකි බව සභාපතිවරයා දැනුම් දී ඇත.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වාර්තා අනුව කදුරුදූවවත්ත ඉඩම සඳහා වන්දි ගෙවීමේදී ගෙවිය යුතු රු.6,017,072 ක් වූ පොලී මුදල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

1.2.3 නොසැසඳූ ගිණුම්

පහත සඳහන් විෂයයන් යටතේ වූ ගිණුම් වලට අදාල උපලේඛණ හා මල්‍ය ප්‍රකාශන අනුව රු.43,332,302 ක වෙනස්කම් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ගිණුම | උපලේඛණ අනුව වටිනාකම | අවසන් මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ජාතික සවිය ගම නැගුම සංවර්ධන වැඩසටහනේ ප්‍රගති වාර්තාව අනුව වියදම | 204,542,752 | 247,360,548 | 42,817,786 |
| ස්ථාවර වත්කම් | 47,752,850 | 48,267,366 | 514,516 |
| | 252,295,602 | 295,627,914 | 43,332,312 |

1.2.4 ලැබියයුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් තිබෙන රු.3,281,827 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද පියවා නොතිබුන අතර මෙම මුදල තුල 1999 වර්ෂයට පෙර ලබාදී තිබූ රු.851,039 ක හඳුනා නොගත් ශේෂයක්ද විය. මේ සම්බන්ධව ඉකුත් වර්ෂවල වාර්තාවන්හිද දක්වා තිබුණද නිරවුල් කිරීම සිදුවී නොතිබුණි.

(ආ) ආංශික අත්තිකාරම් වශයෙන් 1999 වර්ෂයේ සිට 2001 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුල ලබාදී තිබූ රු.2,522,078 කවූ මුදල සමාලෝචිත වර්ෂයේද නිරවුල් කිරීමකින් තොරව ඉදරියට ගෙනවිත් තිබුණි. තවද ඉකුත් වර්ෂවල මාගේ වාර්තාවේද මේ පිළිබඳව දක්වා තිබුණද නිරවුල් කිරීම සිදුව නොතිබුණි.

(ඇ) බදුකුලී අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු.297,000 ක් නිරවුල් නොකර 2004 වර්ෂයේ සිට හඳුනා නොගත් ශේෂයන් ලෙසට ඉදිරියට ගෙනවිත් තිබුණි. තවද 2000 වර්ෂයේදී හම්බන්තොට දිස්ත්‍රික් වාණිජ මණ්ඩල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ගෙවා තිබූ රු.1,000,000 ක්වූ අත්තිකාරම සමාලෝචිත වර්ෂයේද නිරවුල් වී නොතිබුණි.

(ඈ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ රතුළුණු වගාව සඳහා 1998 වර්ෂයේදී ලබාදී තිබූ රු.702,833 ක්වූ මුදල ණය මුදලක් නොව ප්‍රදානයක් බව පසුගිය වාර්තාවට පිළිතුරු සපයමින් දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේද එකී මුදල ලැබිය යුතු ශේෂයක් ලෙසට අවසන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඉ) ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්ය සඳහා වර්ෂ කීපයක සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත තැන්පත් ලෙස ගෙවා තිබූ රු. 3,712,125 ක් සම්බන්ධයෙන් පසු විපරම් කර නිරවුල් කිරීමට හෝ එම ඉඩම් අපේක්ෂිත කාර්යයන්හි යෙදවීමට අධිකාරිය ක්‍රියාකර නොතිබුණි.

(ඊ) වර්ෂ ගණනාවක සිට ගෙවිය යුතු මුදල් ලෙසට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.155,853 ක්වූ ණය හිමි ශේෂ සමාලොචිත වර්ෂයේද නිරවුල් කර නොතිබුණි.

(උ) මාතර දිස්ත්‍රික් කාර්යාලය වෙනුවෙන් 2004 හා 2005 වර්ෂවලදී ගෙවිය යුතු ජල, විදුලි හා බදු කුලී ගාස්තු රු.315,663 ක වියදම රුහුණු 2001 වෙන්චර් කැපිටල් සමාගම මගින් දරා තිබුණි. එම ගෙවිය යුතු මුදල අදාල සමාගමේ රු.43,888,183 ක් වූ ආයෝජන වෙනුවෙන් ලැබිය යුතු ලාභාංශ වලින් හිලව් කරගන්නා ලෙස 2010 මැයි 18 දිනැති ලිපියෙන් අදාල සමාගම වෙත දන්වා තිබුණද එය සිදුව නැති අතර සමාලෝචිත වර්ෂයේද නිරවුල් කර නොතිබුණි.

(ඌ) අධිකාරිය විසින් වර්ෂ ගණනාවකට පෙර ලබාදී තිබූ රු.2,108,204 ක්වූ ණය හා අත්තිකාරම් ආපසු අයකර ගැනීමට 2010 දෙසැම්බර් 31දින වන විටද කටයුතු කර නොතිබුණි.

(එ) විවිධ ව්‍යාපෘති සඳහා විවිධ ආයතන හා පුද්ගලයන් වෙත ගෙවා තිබූ රු.1,326,151 ක්වූ මුදලක් 2011 මාර්තු 31 දින වනවිටද ආපසු අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

## 1.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිවීම නිසා එකී විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය / සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|
| වෙළඳ හා වෙනත් ලැබීම් | | |
| ණය ගැතියෝ | 33,779,137 | ශේෂ සනාථ කිරීම් කාල විශ්ලේෂණ හා අදාල ලිපිගොනු |
| ඉඩම් අත්පත් කර ගැනීමේ තැන්පත | 13,602,115 | ශේෂ තහවුරු කිරීමේ ලිපි |
| ගෙවිය යුතු මුදල් | 26,493,104 | - එම - |
| ගෙවිය යුතු ප්‍රාග්ධන වැය සමාජ සුභසාධන | 7,512,207 | අදාල නිලධාරීන් විසින් වැඩ ඉටු කළ බවට සහතික, අනුමත බිල්පත්, හා ගෙවීම් වවුචර් |
| ගෙවිය යුතු ප්‍රාග්ධන වැය විශේෂ ව්‍යාපෘති | 16,866,615 | - එම - |

## 1.4 නීති,රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති,රීති,රෙගුලාසි ආදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත හා රජයේ මුදල් රෙගුලාසි 880 | පනතේ විධිවිධාන හා මුදල් රෙගුලාසි ප්‍රකාර මුදල්, ගබඩා හා වත්කම් භාරව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප සුරැකුම් ලබාගත යුතු වුවත් අධිකාරියේ මුදල් , ගබඩා භාණ්ඩ හා වත්කම් භාරව කටයුතු කරන නිලධාරීන්ගෙන් එසේ ඇප සුරැකුම් ලබාගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 371 | අත්තිකාරම් මුදල් අදාල කාර්යය නිමවූ විගස පියවිය යුතු වුවත් 1999 වර්ෂයේ සිට 2010 වර්ෂය අවසානය දක්වා ගෙවන ලද රු.6,234,394 ක අත්තිකාරම් 2010 දෙසැම්බර් 31 දිනවන විටත් පියවා නොතිබුණි. |
| (ii) මු.රෙ. 571 | කල් ඉකුත් වූ හා හිමිකම් නොදැක්වූ තැන්පත් මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂා කර බලා ආදායමට ගතයුතු වුවත් තැන්පත් ලේඛනයට අනුව රු.481,488 ක හිමිකම් නොදැක්වූ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. |

(ඇ) අංක අයිඑ්අයි/2000/1 හා 2000 ජුනි 12 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛයේ 01 ඡේදය

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට එක් වරක් වත් රැස්විය යුතු වුවද 2010 වර්ෂයේ රැස්වී තිබුණේ වාර තුනක් පමණි. එමෙන්ම රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/PE/7 හා 2000 මාර්තු 15 දිනැති චක්‍රලේඛය පරිදි අදාල අමාත්‍යාංශයෙන් අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකු කමිටුවට සහභාගී විය යුතු වුවද සහභාගී වී තිබුණේ දෙදෙනෙකු පමණි. 2010 සැප්තැම්බර් දින රහිත ලිපියකින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය නියෝජනය කරමින් නියෝජිතයෙකු පත්කර තිබුණද එම නිලධාරියා කමිටු රැස්වීම් වලට සහභාගී වී නොතිබුණි.

(ඈ) <u>අධ්‍යක්ෂක මණ්ඩල තීරණ</u>

2008 වර්ෂයේ සිට 2010 වර්ෂයේ අප්‍රේල් දක්වා කාල පරිච්ඡේදය තුල අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ගෙන තිබූ තීරණ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු මෙසේය.

(i) 2008/10/04 - කිරිගොවි ගම්මාන වැඩ සටහන

2008/11/02 සංවර්ධන වැඩ සටහන්හි ප්‍රගතිය

2009/01/01- xiv කරන්දෙණිය ටී.ඩී. සමරවීර ක්‍රීඩාංගනයේ ජලය සහ විදුලිය පද්ධතිය නවීකරණය කිරීම.

2009.05.01-v 2009 ක්‍රියාකාර සැලැස්ම

2010.02.01 කදුරුදූවවත්ත ඉඩම

අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මගින් ව්‍යාපෘති අසාර්ථක වීම සම්බන්ධ වගකිවයුතු නිලධාරියාගෙන් නිදහසට කරුණු විමසිය යුතු බවට හා සුදුසු විනය ක්‍රියා මාර්ග ගතයුතු බවට දෙන ලද උපදෙස් ක්‍රියාත්මක කිරීම මන්දගාමී ලෙස සිදුවීම.

(ii) 2009/05/01 - vi කිරල කැලේ ව්‍යාපෘතිය

2009/05/04 - අනුමැතින්ට අදාල ලේඛණ අසම්පූර්ණ වීම හා ව්‍යාපෘතීන් යාවත්කාලීන කල බව පවසා ගෙවීම් කර තිබීම.

අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මගින් විමර්ශණ නිලධාරීන් කමිටුවක් පත් කිරීමට උපදෙස් දී තිබුණද එකී තීරණ ක්‍රියාත්මක කර නොතිබීම.

2009/06/01 - vii ආංශික ප්‍රගතිය 2006 සිට 2008

- අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කරවීම පිළිබඳව අධ්‍යක්ෂ (මුදල් හා පාලන) ගේ 2010 සැප්තැම්බර් 01 හා 2011 පෙබරවාරි 02 දිනැති ලිපි මගින් සියළුම අධ්‍යක්ෂවරුන් හා අංශ ප්‍රධානීන් අමතමින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පරිදි පැවරී ඇති වගකීම් ඉටු කරන ලෙසට දැනුවත් කිරීම් සිදුකර තිබුණද විගණන පරීක්ෂණ අවස්ථාව වන විටද ඉහත සඳහන් තීරණ ක්‍රියාත්මක වීමක් සිදුව නොතිබුණි.

- 2010 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 07 ක් පවත්වා තිබුණු අතර එම වාර 7 ටම සහභාගී වී තිබුණේ සභාපතිවරයාට අමතරව එක් සාමාජිකයෙක් පමණි. අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික සංඛ්‍යාව 07 කි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුල අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.8,672,824 ක ඌණතාවයක් වූ අතර ඉකුත් වර්ෂයේ ඊට ප්‍රතිරූපව රු.112,688 ක අතිරික්තයක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයෙ රු.8,785,512 ක පිරිහීමක් විය. මේ සඳහා ඉකුත් වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආධාර හා වෙනත් ආදායම් රු.1,699,233 කින් අඩුවී තිබීමත්, ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම් රු.7,086,279 කින් වැඩිවී පුනරාවර්තන හා වෙනත් ආදායම් රු.1,699,233 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයෙ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 කොන්ත්‍රාත් පරිපාලනය.

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය බටපොල නැනසල මධ්‍යස්ථානයේ ඉතිරි වැඩ නිම කිරීම

මෙම කර්මාන්තය සඳහා විෂයයන් 05 ක් යටතේ රු.1,739,717 ක් වූ ඇස්තමේන්තුවක් නිර්දේශ කර තිබුණු අතර, ඉදිකිරීම් කටයුතු සඳහා බටපොල බටහිර ඉළුක්පිටිය ග්‍රාම සංවර්ධන සමිතිය සමඟ 2009 අප්‍රේල් 27 දින රු.1,674,198 ක් වටිනා ගිවිසුමක් අත්සන් කර රු.1,557,337 ක මුදලක් ගෙවා තිබුණි. 2009 ජූලි 26 දින වැඩ නිම කර තිබූ මෙම නැනසල මධ්‍යස්ථානය වර්ෂ 1 1/2 ක් තරම් කාලයක් විවෘත කිරීමකින් තොරව පවතින බව 2011 ජනවාරි 24 දිනැති ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) කොහිලවගුර කිරිගම්මාන වැඩසටහන - කරන්දෙණිය, බෝක්කු පද්ධතිය ඉදිකිරීම

ඉහත වැඩ සටහනේ බෝක්කු පද්ධතිය සකස් කිරීම සම්බන්ධයෙන් අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයේ කාර්මික නිලධාරී විසින් විෂයයන් 18 කින් යුක්තව රු.1,693,929 ක් වටිනා ඇස්තමේන්තුවක් පිළියෙල කර 2009 නොවැම්බර් 27 දින දකුණු මාගල ග්‍රාම සංවර්ධන සමිතිය සමඟ රු.1,620,280 ක් වටිනා ගිවිසුමක් අත්සන් කර රු.722,971 ක් ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මාර්ග පද්ධතියට අදාලව ඉදිකල බෝක්කු, 2011 ජනවාරි 20 භෞතික පරීක්ෂණ දින වන විට නඩත්තු නොකිරීමේ ප්‍රතිඵලය මත වල් බිහිවී වැසී ගොස් ජලය ගලා නොබසින තත්ත්වයක පැවතුණි.

(ii) 2011 ජනවාරි 20 පරීක්ෂණ දින වන විට මෙම කිරිගම්මාන ව්‍යාපෘතිය අසාර්ථක ව්‍යාපෘතියක් ලෙස පැවති අතර අදාල භූමි ප්‍රදේශය ශ්‍රී ලංකා යුධහමුදාවට භාරදී තිබුණෙන් මෙම කර්මාන්තය යටතේ වැයකළ රු.722,971 ක වියදම ඵල රහිත වී තිබුණි.

(ඇ) ශාන්ත තෙරේසා කණිෂ්ඨ විද්‍යාලය, ශාන්ත තෙරේසා බාලිකා මහා විද්‍යාලය හා ශාන්ත මරියා මහා විද්‍යාලයට අයත් ක්‍රීඩා පිටිය සංවර්ධනය

වතු යටිතල පහසුකම් සංවර්ධන හා ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජාතික සවිය ගම නැඟුම ව්‍යාපෘති ප්‍රතිපාදන මගින් පස් කපා ක්‍රීඩා පිටිය පුලුල් කිරීමට හා මායිම් වැට ඉදිකිරීමට පිළිවෙලින් රු.1,590,440 ක් හා රු.1,553,662 ක් වූ ඇස්තමේන්තු පිළියෙල කර පස් කපා ක්‍රීඩා පිටිය පුලුල් කිරීමට 2008 අගෝස්තු 25 දින ග්‍රාම සංවර්ධන සමිතියක් සමඟ රු.1,590,440 ක් වූ ගිවිසුමක්ද මායිම් වැට ඉදිකිරීමට 2008 අගෝස්තු 22 දින තවත් ග්‍රාම සංවර්ධන සමිතියක් සමඟ රු.1,553,662 ක ගිවිසුමක්ද අත්සන් කර රු.2,947,775 ක් ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් 2011 ජනවාරි 20 දිනැති ස්ථානීය පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ක්‍රීඩා පිටිය පස් කපා ඉවත් කිරීම සඳහා දී තිබුණු කොන්ත්‍රාත්තුව අනුව ඉවත් කරන ලද පස් කියුබ් 1,440 කට රු.1,590,440 ක් ද යොදන ලද යන්ත්‍ර පැය 120 ක් වෙනුවෙන් රු.225,960 ක් ගෙවා තිබුණු නමුත් මිනුම් විස්තර විගණනයට ඉදිරිපත් නොවීය.

(ii) මෙම කර්මාන්තයෙන් අපේක්ෂා කලේ පාසැල් තුනක ශිෂ්‍ය පිරිසකගේ අවශ්‍යතාවන් වෙනුවෙන් තිබෙන ක්‍රීඩා පිටිය පුළුල් කිරීම වුවත් පාසැල් තුනේ විදුහල්පතිවරුන්ගේ 2011 ජනවාරි 20 දිනැති ලිඛිත ප්‍රකාශ අනුව ඉදිකිරීම් කර තිබූ ක්‍රීඩා පිටියේ තත්වය අසාර්ථක බවත් ඉදිකිරීම් කිරීමෙන් අනතුරුව පෙර තිබුණ කුඩා කොටස හෝ ප්‍රයෝජන ගත නොහැකි තත්වයට පත්වී ඇති බවත් ප්‍රකාශ කර තිබුණි. ඒ අනුව මෙම කර්මාන්තය සඳහා දරන ලද රු. 2,947,775 ක වියදම ඵලරහිත වී තිබුණි.

(iii) මෙම ඉදිකිරීම් කටයුතු සිදුකළ සමිති විගණනය වෙත කරන ලද ලිඛිත ප්‍රකාශ අනුව ගිවිසුම් වලට එළඹී තිබූ සමිති දෙකම මෙම ඉදිකිරීම් කර්මාන්තය සිදුකර නොතිබූ අතර සමිති නමින් ලියන ලද චෙක්පත් මාරු කර මුදල් උප කොන්ත්‍රාත්කරුට ලබාදීම පමණක් සිදුකල බවත් ප්‍රකාශ කර තිබුණි.

(iv) ජාතිය ගොඩනැගීමේ හා වතුයටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක චක්‍රලේඛ/ගමනැගුම/03/2008 හා 2008 අප්‍රේල් 29 දිනැති චක්‍රලේඛයේ 5 ඡේදය පරිදි ප්‍රමාණ පත්‍ර ක්‍රමයට ඇස්තමේන්තු සකස් කළ යුතු අතර ඇස්තමේන්තුවේ වටිනාකමින් යටත් පිරිසෙයින් 20% ක් ප්‍රජාදායකත්වය සඳහා අඩු කළ යුතු වුවද එසේ නොකර මුළු ඇස්තමේන්තුගත වටිනාකම සඳහාම ගිවිසුම් අත්සන් කර තිබුණෙන් වැඩිපුර ගෙවා තිබූ මුදල රු. 432,493 ක් විය.

(v) ඉදිකිරීම් භූමියේ භූ විෂමතාවය අධ්‍යයනය කර ඉදිකිරීම් සැලසුම් කළ යුතුව තිබුණත් ඇස්තමේන්තුව තුලින් ඒ සඳහා ප්‍රතිපාදන ලබාදී නොතිබුණි. ඒ අනුව මෙම ක්‍රීඩා පිටිය පුළුල් කිරීමක් නොව පස්කපා ඉවත් කිරීමක් පමණක් සිදු වී තිබූ බව 2011 ජනවාරි 20 දිනැත භෞතික පරීක්ෂාවෙන් තහවුරු විය.

2.3 කාර්ය සාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

2.3.1 ජාතික සවිය ගමනැගුම වැඩ සටහන යටතේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොවීන් සඳහා පාළු පැල ලබාදීම

උක්ත කරුණ සම්බන්ධයෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය හා බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ වලට අයත් සියඹලාගුණය, මයිලගස්තැන්න හා පල්ලේගම ගම්මාන වල යථෝක්ත දෙපාර්තමේන්තුවට අයත් රබර් වගා ගොවීන් අතර රු.408,000 ක් වටිනා රබර් පැල 8160 ක් මිලදී ගෙන බෙදා දීමටත් ඊට අදාල බෙදුම් ලැයිස්තු හා පසු විපරම් හා ප්‍රගති වාර්තා පිළියෙල කිරීමටත් නියමිත විය. ඉදිරිපත් වූ තොරතුරු අනුව උක්ත කාරණය සම්බන්ධයෙන් ප්‍රගතිය පහත දැක්වේ.

(අ) මොණරාගල දිස්ත්‍රික් කළමනාකරණ ප්‍රධාන කාර්යාලයේ ආංශික කළමනාකරු (වැවිලි)ගේ අනුමැතිය යටතේ 2010 වර්ෂයේදී රු.403,000 ක් ගෙවා රබර් පැල 8160 ක් ලබාගෙන ගොවීන් අතර බෙදා හැර තිබුණු නමුත් එක් එක් ගොවියාට බෙදාදුන් පැල ගණන, භාරගත් බවට අත්සන් සහිත බෙදුම් ලැයිස්තු හා බෙදාදුන් පැල වගාකර තිබේද යන්න පිළිබඳව පසුවිපරම් කිරීම් හා ප්‍රගතිය පිළිබඳ වාර්තා පිළියෙල කර නොතිබුණෙන් වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳව ඇගයීමට නොහැකි විය.

(ආ) ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශ ලේකම්ගේ 2008 මාර්තු 08 දිනැති චක්‍රලේඛ අංක ගමනැගුම 1/2008 හි 6 වන ඡේදය පරිදි ඉහත පරිදි පුද්ගල දීමනා ලෙස රබර් පැල මිලදී ගෙන බෙදා දීම සඳහා ප්‍රතිපාදන නොමැති වුවද එය නොසලකා ජාතික සවිය ගම නැගුම සංවර්ධන වැඩ සටහන අයත් රු.403,000 ක මුදල් ඉහත පුද්ගල දීමනා ලෙස ගොවීන් අතර ගෙවා තිබුණි.

2.3.2 කොහිලවගුර කිරිගොවි ගම්මානයේ අක්කර 3 ක් සඳහා ජලය සැපයීම ව්‍යාපෘතිය

(අ) උක්ත කරුණ සම්බන්ධයෙන් අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය මගින් රු.246,248 ක ඇස්තමේන්තුගත විෂයයන් 11 කින් යුත් අඩි 15 ක් ගැඹුරු හා අඩි 3 ක් විෂ්කම්භය සහිත ළිඳක් ඉදිකර වතුර මෝටරයක් සපයා සවිකර කොහිල වගුර කිරිගොවි ගම්මානයේ අක්කර 3 ක් සඳහා ජලය සැපයීමට ඉලක්ක කර තිබුණි.

(ආ) මෙම ව්‍යාපෘතිය සඳහා කරන්දෙනිය ප්‍රදේශයේ සමෘද්ධි සමිතියක් සමඟ 2009 පෙබරවාරි 29 දින රු.223,861 ක් වටිනා ගිවිසුමක් අත්සන් කර විෂයයන් 07 ක් සඳහා ඉටුකල වැඩ වෙනුවෙන් 2010 ඔක්තෝබර් 07 දින රු.96,527 ක මුදලක් ගෙවා තිබුණි. විෂය අංක 8,9,10,11 ට අයත් P.V.C පයිප්ප හා උපාංග සපයා සවි කිරීම සිදුව නොතිබූ අතර 2011 ජනවාරි 20 දිනැති ස්ථානීය පරීක්ෂණ අවස්ථාව වන විට ළිඳ වටා ඉදිකල ආවරණ බැම්මේ පිපිරීම් හා කයිරු බැමි පුපුරා කඩා වැටී ප්‍රයෝජනයට ගත නොහැකි ලෙසට වල්බිහිවී තිබුණි.

(ඇ) (i) යථෝක්ත ව්‍යාපෘතිය මගින් ඉලක්ක කල අක්කර 3 ක් සඳහා ජලය සැපයීම විගණන පරීක්ෂණ දිනටද සිදුව නොතිබුණි.

(ii) ළිඳ අඩි 15 ක් ගැඹුරට කැපීමට රු.15,000 ක් ඇස්තමේන්තු කලද ඉටුකල ප්‍රමාණය 25% ක් ලෙසට ගණනය කර රු.3,750 ක් ගෙවීම් කර තිබුණෙන් ළිඳ කැපීම නියමිත පරිදි සිදුව නොතිබුණි.

(iii) විෂය අංක 07 පරිදි ඇස්තමේන්තු වටිනාකම රු.27,000 ක් වූ ලීටර් 1500 ක ප්ලාස්ටික් ටැංකියක් සපයා කොන්ක්‍රීට් කුළුණක් ඉදිකිරීම කළ යුතු වුවද ප්ලාස්ටික් වතුර ටැංකිය සැපයීමකින් තොරව 75% ඉටු කල බව දක්වමින් රු.20,250 ක් ගෙවා තිබුණි.

(iv) විෂය අංක 06 පරිදි රු.50,400 ක් ගෙවා තිබූ වතුර මෝටරය ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ තබා තිබුණි.

(v) මෙම ව්‍යාපෘතියට අයත් කොහිල වගුර ව්‍යාපෘතිය අසාර්ථක එකක් වූයෙන් විගණන පරීක්ෂණ දින වන විට ළිඳ ඉදිකල ඉඩම සමඟ ශ්‍රී ලංකා යුධ හමුදාවට පවරා තිබුණෙන් වැයකල රු.96,527 ක වියදම ඵලරහිත වී තිබුණි.

2.3.3 කොහිල වගුර ව්‍යාපෘතිය - ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්දෙණිය මැතිවරණ කොට්ඨාශය

ආදර්ශ කිරි ගම්මාන, වාණිජ පොල් වගා, නිවාස සංවර්ධන හා සංචාරක යන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා 2007 දෙසැම්බර් 31 දින අංක 1530/9 දරන ගැසට් පත්‍රය මගින් අක්කර 188ක වපසරියකින් ඇති කොහිලවත්ත ඉඩම පවරා ගත් අතර ඉඩමේ මූලික සංවර්ධන කටයුතු සඳහා රු.5,627,923 ක මුදලක් අධිකාරිය වැය කර තිබුණි.

2005 ජූනි 05 දින ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රගති සමාලෝචන රැස්වීමේදී ජාතික සවිය හා ගම නැඟුම වැඩසටහන යටතේ වෙන් කර ඇති මුදල් මෙම වැඩසටහනට නොයොදවන ලෙස ගත් ප්‍රත්පත්තිමය තීරණය මත ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අත්හැර දමන ලද අතර අක්කර 188 ක් වූ මුළු ඉඩමෙන් අක්කර 22 රූඩ් 03 පර්චස් 28 ක් අධිකාරියේ සන්තකයේ තබා ගෙන ඉතිරි ප්‍රමාණය යුධ හමුදාවට පවරා දෙනු ලැබීය .එහෙත් අධිකාරිය විසින් වියදම් කළ රු.5,627,923 ක මුදල අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.3.4 උපදේශක ගාස්තු ගෙවීම.

(අ) ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ උපදේශකවරයෙකු ජනාධිපති ලේකම්ගේ 2005 දෙසැම්බර් 28 දිනැති අංක DMD/5 දරණ ලිපියෙන් පත්කර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2006 දෙසැම්බර් 26 දිනැති අංක SDA/05/W/70 දරණ ලිපියෙන් හා 2011 පෙබරවාරි 08 දිනැති ලිපි මගින් අධිකාරිය තුල ඉටුකළ යුතු රාජකාරි පහක් පවරා තිබුණි.

(ආ) මෙම රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් 2010 වර්ෂය තුල වැටුප්, ඉන්ධන, වාහන අලුත්වැඩියා හා දුරකථන ගාස්තු වෙනුවෙන් රු.689,163 ක් වැය කර තිබූ අතර උපදේශකවරයා වෙත පවරන ලද රාජකාරි ඉටුකල බවට තහවුරු කර ගැනීමට ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. ඉටුකල රාජකාරි පිළිබඳ විගණනය විමසුම් කල විට පිළිතුරු ලෙස " රාජකාරි ප්‍රායෝගිකව ඉටුකරමින් සිටී" යනුවෙන් පමණක් දන්වා තිබුණි.

(ඇ) (i) මේ අනුව පවරන ලද රාජකාරි නිසි පරිදි ඉටු කලේද යන්න අපැහැදිලි වුයෙන් උපදේශකවරයාට අධිකාරිය 2010 වර්ෂය වෙනුවෙන් වැයකළ රු.689,163 ක මුදලට සරිලන සේවාවක් ලැබුණේද යන්න ඇගැයීම කළ නොහැකි විය.

(ii) ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ 2006 මාර්තු 28 දිනැති අංක MRD/SEC/5 දරණ ලිපිය අනුව ඉහත උපදේශවරයා පත්කර ඇත්තේ අධිකාරිය පනතේ 25(1) වගන්තිය පරිදි බව දක්වා තිබුණද, එකී වගන්තියෙන් දක්වා තිබුණේ අධිකාරියේ කර්තව්‍ය කාර්යක්ෂම කිරීම සඳහා වූ කාර්ය මණ්ඩල පත් කිරීම් පිළිබඳවය.

2.3.5 කදුරුදුව වත්ත ඉඩම

(අ) දකුණු පළාත් ගාල්ල දිස්ත්‍රික්කයේ අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කදුරුදුව වත්ත නැමැති ඉඩම ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය සඳහා අධිකාර පනතේ 17 වගන්තිය පරිදි පවරා ගෙන ඒ සඳහා වන්දි හා පොලි ලෙසට 1998 සිට 2005 දක්වා වූ කාල පරිච්ජේදය තුල ගෙවා නිම කිරීමේ රු.17,225,800 ක වියදමක් ඉලක්ක කර තිබුණි.

(ආ) (i) අධිකාරියේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ 1998 ජනවාරි 02 දිනැති ලිපිය හා 1998 සැප්තැම්බර් 11 දිනැති අංක 1044/31 දරන ගැසට් පත්‍රය පරිදි ඉඩම පවරා ගැනීම සිදුව නොතිබූ අතර 1998 නොවැම්බර් 06 දින අක්මිමණ ප්‍රාදේශීය ලෙකම්වරයා භාරගෙන තිබූ ඉඩම් කැබලි 14 අධිකාරිය වෙත 2006 මැයි 28 දින වන විට භාර ගැනීම නිම කර තිබුණි. තවද ඉඩම සඳහා රු.10,539,989 ක් වූ වන්දි මුදල 1998 අගෝස්තු 19 දින හා 2007 අගෝස්තු 31 දින අක්මීමන ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ගෙවා තිබුණද 1998 නොවැම්බර් 06 දින අක්මීමන ප්‍රාදේශය ලේකම්වරයා භාරගත් ඉඩම අධිකාරිය විසින් භාර ගැනීම කර තිබුණේ 2006 මැයි 28 දිනදීය. තවද අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) අංක 999/9 ගැසට් නිවේදනය අනුව පවරාගත් ඉඩම් ප්‍රමාණය අක්කර 24 රූඩ් 01 පර්චස් 01 ක් වුවද ගාල්ල දිස්ත්‍රික් අධ්‍යක්ෂකගේ 2002 දෙසැම්බර් 04 හා අක්මීමන ප්‍රාදේශීය ලේකම්ගේ 2002 දෙසැම්බර් 16 දිනැති ලිපි අනුව ඉඩම තක්සේරු කිරීමට ඉල්ලා තිබුණේ අකකර 19 රූඩ් 02 පර්චස් 14 ක් ලෙසට හෙයින් පවරා ගත් ඉඩමේ ප්‍රමාණය පිළබඳව හා තක්සේරු කිරීමත් අතර වෙනසක් ඇති බව නිරීක්ෂණය විය.

(iii) ගාල්ල දිස්ත්‍රික් අධ්‍යක්ෂවරයා 2002 දෙසැම්බර් 04 දිනැතිව ඉඩමේ වටිනාකම තක්සේරු කර දෙන ලෙසට අක්මීමන ප්‍රාදේශීය ලේකම්වරයාට දන්වා යවා ඇති අතර ඒ අනුව ප්‍රාදේශීය ලේකම්වරයා 2002 දෙසැම්බර් 16 දිනැතිව ඉඩමේ දියුණු නොදියුණු වටිනාකම ඉල්ලා තිබුණි. ඒ අනුව ප්‍රධාන තක්සේරුකරු 2003 ජුනි 16 දිනැති ලිපියෙන් රු.2,800,000 කටද 1997 නොවැම්බර් 13 දිනැතිව රු.3,000,000 කටද, 2006 අගෝස්තු 02 හා 2002 නොවැම්බර් 06 දිනැති ලිපි මගින් කැබලි 20 කට වටිනාකම රු.10,567,800 ක් ලෙසටද ගණනය කර තිබුණි. මේ අනුව වන්දි ගෙවීමේ ක්‍රියාවලියේදී වගකිවයුතු නිලධාරින්ගේ අසාමාන්‍ය ප්‍රමාදය හේතුවෙන් රුපියල් මිලියන 03 ක් වූ වියදම සඳහා රුපියල් මිලියන 10.5 ක පිරිවැයක් දැරීමට සිදුව තිබුණි.

(iv) අක්මීමන ප්‍රාදේශීය ලේකම්ගේ 2011 මාර්තු 31 දිනැති ලිපිය පරිදි ලැබී තිබූ වන්දි මුදලින් හිමිකම් කියන්නන් 48 කට 2011 මාර්තු 31 දින රු.6,940,275 ක් ගෙවා තිබූ අතර රු.3,649,530 ක මුදලක් නොගෙවා ඉතිරිව තිබුණි.

(v) අධිකාරිය අනවසර පදිංචිකරුවන් තිදෙනෙකු ඉවත් කිරීම වෙනුවෙන් රු.300,000 ක වන්දි මුදලක් ගෙවා තිබූ අතර 2011 මාර්තු 23 දින වන විටත් අනවසරකරුවන 04 දෙනෙකු පදිංචිව සිටින බවට නිරීක්ෂණය විය. තවද ඉඩම වටා මායිම් වැටක් හෝ සීමා ලකුණු කිරීමක් නොවීම හේතුවෙන් ඉඩමේ නිරවුල් භුක්තියට බාධාවක් විය හැකි බව නිරීක්ෂණය විය.

2.3.6 <u>නිල්වලා ගඟ ව්‍යාපෘතියේ යකඩ පාරුව</u>

පහත කරුණ නිරීක්ෂණය විය.

(අ) මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ යටතේ ක්‍රියාත්මක වූ විදේශීය සමාගමකට අයත් ව්‍යාපෘතියක් අත්හැර උමාගිය යකඩ පාරුවක් අලුත්වැඩියා කර භාවිතා කිරීමට පුද්ගලික ආයතනයකට 2007 ජනවාරි 31 දින වාර්ෂික බදු පදනම මත වර්ෂ 10 කට රු.57,448 ක මුදලට බදුදී තිබුණි.

(ආ) බදු ගැනුම්කරුගේ වියදමින් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට එකඟතාවය ඇතිකරගෙන තිබූ යකඩ පාරුව ගිවිසුම්කරු රැගෙන යාමට කටයුතු කිරීමේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව එයට එරෙහිව නතිමය පියවර ගෙන තිබුණි. මේ පිළිබඳව අධිකාරිය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග හා නීතිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශ මගින්ද අත්පත් කර ගැනීම හා ආයෝජකයා වෙත පවරා දීම නිවැරදි බව තහවුරු කර තිබුණි. එහෙත් යකඩ පාරුව රැගෙන යාමට නොහැකි වීම මත සිදුවී ඇති පාඩුව ලෙසට රුපියල් මිලියන 158 ක වන්දියක් අධිකාරියෙන් ඉල්ලා ගිවිසුම්කරු 2011 පෙබරවාරි 23 දිනැතිව එන්තරවාසියක් එවා තිබුණි.

2.3.7 <u>සුරතල් මසුන් ඇතිකිරීමේ ව්‍යාපෘතිය</u>

(අ) ගාල්ල, මාතර, හා හම්බන්තොට දිස්ත්‍රික්කවල 2000/2001 ආයෝජන සැලැස්ම ප්‍රකාරව විසිතුරු මත්ස්‍ය වගා සාමාජිකයන්ට ණය මුදලක් ලෙසට එක් ඒකකයකට රු.150,000 ක් ලබාදීම වසර දෙකකින් පසු දෙනු ලැබූ ණය මුදලින් 1/3 ක් ආධාර ලෙස නිදහස් කිරීමත් ඉලක්ක කර තිබුණි.

(ආ) මෙම ව්‍යාපෘතිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ මත්ස්‍ය වගාකරුවන් 15 කට රු.1,489,958 ක්ද මාතර දිස්ත්‍රික් වගාකරුවන් 13 කට රු.950,000 ක්ද හම්බන්තොට දිස්ත්‍රික්කයේ වගාකරුවන් වෙත රු.1,500,000 ලෙසට රුපියල් මිලියන 3.95 ක් වැයකර තිබූ අතර ණය ලබාගත් සමූපකාර සමිති අක්‍රිය වීම නිසා ලබාදුන් ණය මුදල ආපසු අයකර ගැනීමටද නොහැකි වී තිබුණි.

(ඇ) මෙම ව්‍යාපෘතිය යටතේ විසිතුරු මත්ස්‍ය වගා සමූපකාර සමිති වෙත ණය මුදල් ලබාදීමට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලැබී නොතිබුණි.

(ඈ) මෙම ණය මුදල ප්‍රදානයක් සේ සලකා කටයුතු නොකිරීමට 2011/2 දරණ 2011 මාර්තු 01 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. 2000/2001 කාල වකවානුව තුල කටයුතු කළ ආංශික කළමණාකරු (ධීවර) හා අධ්‍යක්ෂ (මුදල් හා පාලන) යන නිලධාරීන්ගේ අනිසි මුදල් කළමනාකරණය හා පරිහරණය හේතුකොට ගෙන සිදුවූ විෂමතාවයක් හෙයින් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට පොලිස් විශේෂ අපරාධ විමර්ෂණ අංශයේ සහයෝගය ලබා ගැනීමට තීරණය කර තිබුණද එය ක්‍රියාත්මක වී නොතිබුණි.

2.3.8 (අ) සමාලෝචිත වර්ෂය තුල ජාතික සවිය ගමනැගුම වැඩ සටහන යටතේ ගාල්ල, මාතර, හම්බන්තොට, මොණරාගල දිස්ත්‍රික්ක 4 සඳහා ව්‍යාපෘති 833 ක් වෙනුවෙන් රු.234,971,818 ක මුදලක් වෙන්කර ඉන් ව්‍යාපෘති 460 ක් නිම කිරීම වෙනුවෙන රු.157,494,331 ක් වැයකර තිබුණි. ව්‍යාපෘති 350 කට අදාල ප්‍රතිපාදනය වූ රු.77,477,487 ක මුදල වැය නොකර ඉතිරි වී තිබුණි. ඉතිරියේ ප්‍රතිශතය සියයට 32.9% ක් විය.

| දිස්ත්‍රික්කය | මූල්‍ය ප්‍රගතිය | | | | | | භෞතික ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත මුදල | වෙන්කල මුදල | ප්‍රජා දායකත්වය | වැයකල මුදල | ඉතිරිය | වෙන්කල මුදලින් වියදම්කල ප්‍රතිශතය | ඉලක්ක කල ව්‍යාපෘති සංඛ්‍යාව | නිමකල ව්‍යාපෘති සංඛ්‍යාව | නිම නොකල ව්‍යාපෘති සංඛ්‍යාව | භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය |
| | රු. | රු. | රු. | රු. | රු. | % | | | | % |
| ගාල්ල | 54,632,014 | 45,370,939 | 9,261,074 | 26,627,237 | 18,743,702 | 58.68 | 156 | 103 | 53 | 66.0 |
| මාතර | 59,091,649 | 50,626,348 | 8,465,301 | 31,591,994 | 19,034,554 | 62.40 | 168 | 69 | 99 | 41.0 |
| හම්බන්තොට | 46,151,658 | 39,493,382 | 6,658,277 | 28,057,647 | 11,435,735 | 71.0 | 172 | 100 | 72 | 58.1 |
| මොනරාගල | 30,061,205 | 25,697,500 | 4,363,705 | 13,234,581 | 12,462,919 | 51.5 | 165 | 87 | 78 | 52.7 |
| කඩිනම් සංවර්ධන වැඩසටහන | | | | | | | | | | |
| ගාල්ල | 21,984,856 | 18,328,761 | 3,656,096 | 15,680,772 | 2,647,989 | 85.5 | 40 | 38 | 02 | 95.0 |
| මාතර | 28,078,665 | 23,398,888 | 4,679,778 | 18,168,648 | 5,230,240 | 77.6 | 52 | 40 | 10 | 76.9 |
| හම්බන්තොට | 20,880,000 | 17,400,000 | 3,480,000 | 13,747,498 | 3,652,502 | 79.0 | 34 | 00 | 34 | 00.0 |
| මොනරාගල | 15,000,000 | 12,500,000 | 2,500,000 | 10,218,343 | 2,281,657 | 81.7 | 25 | 23 | 02 | 92.0 |
| රේඛීය ආයතන සම්බන්ධීකරනයෙන් කරනු ලබන ව්‍යාපෘති | 33,748,000 | 2,156,000 | 1,078,000 | 167,611 | 1,988,389 | 7.7 | 21 | 00 | | 00.0 |
| | | 234,971,818 | | 157,494,331 | 77,477,487 | | 833 | 460 | 350 | |

(ආ) වැඩ සටහන

| වැඩ සටහන | වෙන්කළ මුදල | වැයකළ මුදල | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| යටිතල පහසුකම් සංවර්ධනය | 159,722,019 | 90,760,117 | 68,961,902 |
| ආර්ථික හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් | 4,093,977 | 3,235,060 | 858,917 |
| අධ්‍යාත්මක සංවර්ධන වැඩසටහන් | 4,421,960 | 2,695,060 | 1,726,900 |
| දැයට කිරුළ ප්‍රදර්ශනය | 668,200 | 287,480 | 380,720 |
| ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම | 36,500,000 | 40,016,354 | (3,516,354) |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම | 3,000,000 | 1,121,474 | 1,878,526 |
| අභ්‍යන්තර සේවක පුහුණුව | 500,000 | 427,209 | 72,791 |
| පරිපාලන වියදම් 2% | 4,359,983 | 2,350,657 | 2,009,326 |
| | 213,266,139 | 140,893,411 | 72,372,728 |

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) අධිකාරියේ සංයුක්ත සැලැස්මට අයත් කිසිදු ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබූ අතර රු.120,201,203 ක් වූ මෙහෙයුම් වියදම්ද අධිකාරියේ කාර්ය මණ්ඩලය හා එහි සම්පත් යනාදිය අධිකාරියේ අරමුණුවලට පරබාහිරවූ ජාතික සවිය ගම නැගුම වැඩ සටහනේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යොදවා තිබුණි.

(ii) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2010 වර්ෂයේ විසර්ජන ගිණුමේ 105-2-1-3 වැය ශීර්ෂය යටතේ අධිකාරිය වෙත පුනරාවර්තන ආදායම් ලෙසට රු.මිලියන 106 ක් ඇස්තමේන්තු කර තිබූ අතර ඉන් රු.මිලියන 105.6 ක් ප්‍රතිපූර්ණය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ සේවක වැටුප් සඳහා රු.85,300,000 ක මුදලක් අයවැය ලේඛණයෙන ප්‍රතිපාදනය කර තිබූ අතර පතිපූර්ණය වී තිබුණේ රු.80,427,000 ක් පමණි. එහෙත් තථ්‍ය වියදම රු.83,786,508 ක් වූයෙන් වෙනස රු.3,359,508 ක් වූ මුදල අධිකාරියට අතිරේක වැය බරක් වී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසානයට අවසන් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන කෙරීගෙන යන වැඩ වටිනාකම තුළ 2000 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාල පරිච්ජේදයට අයත් රු.2,424,175 ක් වටිනා ව්‍යාපෘති 07 ක වැඩ නිම නොකර ඉදිරියට ගෙන එමින් පැවතුණි.

2.4 වාහන උපයෝජනය

සමාලෝචිත වර්ෂයේදී මෝටර් රථ 12 ක්, කැබ් රථ 19 ක් බවුසර් 04 ක් ලොරිරථ 07 ක් සහ වෑන් රථ 02 ක් අධිකාරියේ ප්‍රවාහන ඇණිය සතුවිය. මෙම ඩීසල් හා පෙට්‍රල් වාහන උපයෝජනය පිළිබඳ වැදගත් දත්ත විශ්ලේෂණයක් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | පෙට්‍රල් | | ඩීසල් | |
|---|---|---|---|---|
| | 2010 | 2009 | 2010 | 2009 |
| ඉන්ධන වියදම රු. | 254,522 | 363,480 | 1,794,982 | 2,946,695 |
| අලුත්වැඩියා හා නඩත්තු වියදම රු. | 295,560 | 368,234 | 3,629,696 | 3,716,153 |
| රියදුරු වැටුප්, බටා හා අතිකාල රු. | 488,293 | 245,630 | 4,165,641 | 4,526,290 |
| මුළු පිරිවැය රු. | 1,038,375 | 977,344 | 9,590,319 | 11,189,138 |
| ධාවනය කර ඇති මුළු දුර කිලෝමීටර් | 61,762* | 52,391 | 507,160 | 533,424 |
| පරිභෝජනය කර ඇති ඉන්ධන ප්‍රමාණය ලීටර් | 1,647 | 2,913 | 27,911 | 36,752 |
| ඉන්ධන ලීටරයකට ධාවනය කළ සාමාන්‍ය දුර කි.මී. | 37.49 | 17.98 | 18.17 | 14.51 |
| කිලෝමීටරයකට ඉන්ධන සඳහා සාමාන්‍ය වියදම රු. | 4.12 | 6.93 | 3.53 | 5.52 |
| කිලෝමීටරයකට අලුත්වැඩියා හා නඩත්තු සාමාන්‍ය වියදම රු. | 4,78 | 7.02 | 7.15 | 6.96 |
| කිලෝමීටරයකට රියදුරු පාරිශ්‍රමික සඳහා සාමාන්‍ය වියදම රු. | 7.90 | 4.68 | 8.21 | 8.48 |
| කිලෝමීටරයක් සඳහා සමස්ථ සාමාන්‍ය වියදම රු. | 16.81 | 18.65 | 18.90 | 20.97 |

* බාහිර ආයතන වෙත ලබා දී තිබූ වාහන ධාවනය කර තිබූ කිලෝමීටර් ගණන මීට ඇතුලත් නැත.

(අ) අධිකාරියේ සම්පත් වෙනත් පුද්ගල හා රාජ්‍ය ආයතන වෙත ලබාදීම.

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව අධිකාරිය සතු වාහන රේඛීය අමාත්‍යාංශය හා බාහිර පුද්ගලයන් වෙත මුදා හැර තිබුණි.

| වාහන අංකය | වාහන වර්ගය | මුදාහල දිනය | වාහනය පරිහරණය කරන ආයතනය/පුද්ගලයාගේ නම |
|---|---|---|---|
| 59-0466 | ටොයොටා ඩබල් කැබ් | 2007.03.09 | දිස්ත්‍රික් සම්බන්ධීකාරක |
| 300-0546 | නිශාන් ඩබල් කැබ් | 2006.05.05 | උපදේශක |
| 57-5713 | ඩබල් කැබ් | 2007.04.07 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය |
| 65-0964 | ජීප් | 2002.03.04 | -එම- |
| 65-1950 | ජීප් | 2003.06.21 | -එම- |
| 65-0838 | ජීප් | 2008.08.17 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 59-0315 | ඩබල් කැබ් | | ගරු නියෝජ්‍ය අමාත්‍යවරයාගේ රාජකාර් සඳහා |

(ආ) අධිකාරයේ වාහන අවිධිමත් ලෙස භාවිතා කිරීම.

අධිකාරියට අයත් රු.12,000,000 ක් වටිනා මෝටර් රථයක් 2007 මාර්තු 09 දින සිට නිලධාරියෙකුට අනුයුක්ත කර තිබුණි. දකුණු පළාත් සභා ඡන්දයට අපේක්ෂකයෙකු වශයෙන් මෙම නිලධාරියා ඉදිරිපත් වීම හේතු කොට ගෙන 2009 අගෝස්තු 28 දින සිට සේවයෙන් ඉවත් වී තිබුණු අතර, 2011 පෙබරවාරි 18 දිනටද වාහනය ආපසු භාරදී නොතිබුණි.

මෙම වාහනයට 2009 සැප්තැම්බර් සිට 2011 පෙබරවාරි දක්වා කාල පරිච්ඡේදය තුල අධිකාරියේ අරමුදලින් සේවා කිරීම්, අලුත්වැඩියා කිරීම්, රක්ෂණය නිරීම් හා ආදායම් බලපත්‍ර ලබා ගැනීම වෙනුවෙන් රු.450,725 ක මුදලක් වැය කර තිබුණි.

2.5 අක්‍රීය ගිණුම් ශේෂ

2002 වර්ෂයේ සිට ලැබිය යුතු ශේෂ තුල දැක්වෙන දැනට ක්‍රියාකාර තත්වයේ නොමැති ආයතන හතරකින් රු.108,173 ක මුදලක් අයවීමට තිබුණි. මෙම මුදල් ඒ ඒ අවස්ථාවල අයකර ගැනීමට අදාල ආංශික කළමනාකරුවන්ගේ නොසැලකිල්ල හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වී තිබූ බව නිරීක්ෂණය විය.

2.6 සංයුක්ත සැලැස්ම

(අ) අධිකාරිය තම කටයුතු මෙහෙයවීම සඳහා 2008 සිට 2010 දක්වා කාල පරිච්ඡේදය සඳහා ගාල්ල, මාතර, හම්බන්තොට හා මොනරාගල දිස්ත්‍රික්කවල හා කොලොන්න, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ අංශ අටක් යටතේ රුපියල් මිලියන 2,127.74 ක් වැය කිරීමට සංයුකත සැලැස්මක් පිළියෙල කර තිබුණද, ඉන් බැහැරව සැලැස්මට පරිබාහිර වූ ජාතික සවිය ගම නැගුම ආදී වැඩ සටහන යටතේ වූ කාර්යයන් ඉටුකිරීම කෙරෙහි අවධානය යොමුකර තිබුණි.

(ආ) ආයතනයේ ප්‍රධාන අරමුණුවල ඇතුලත් පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබූ අතර ඊට අදාළ සැලසුම් සැකසීමටද සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුල කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(i) නිෂ්පාදනශීලීත්වය නංවාලීම, ආර්ථික සංවර්ධනය වැඩිදියුණු කිරීම සහ ආදායම් සහ රැකියා අවස්ථා ජනනය කිරීම අරඹයා වූ සංවර්ධන ව්‍යාපෘති නම් කළ ප්‍රදේශ තුළ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(ii) නම් කළ ප්‍රදේශයේ සමස්ථ සංවර්ධන සැලැස්මෙන් හඳුනා ගනනා ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රමුඛත්ව පදනමක් මත සවිස්තරව අධ්‍යයනය කිරීම.

(iii) යම් නිශ්චිත ව්‍යාපෘති හෝ වැඩසටහන් සඳහා විදේශීය අරමුදල් සපයා ගැනීමට අදාල අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටීම.

(iv) (ii) ඡේදයේ සඳහන් අධ්‍යයන කිරීම සහ නම් කළ ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ආණ්ඩුවේ දෙපාර්තමේන්තු , රාජ්‍ය ආයතනවල, පළාත් පාලන ආයතනවල, රාජ්‍ය සංස්ථාවල සහ පොදු හෝ පෞද්ගලික තැනැත්තන්ගේ සහයෝගය ලබා ගැනීම සහ

(v) (ii) ඡේදයේ සඳහන් අධ්‍යයන කිරීම සහ නම් කළ ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විදේශීය සහ දේශීය පෞද්ගලික අංශයේ නියෝජ්‍යායතනවල සහභාගීත්වය ලබා ගැනීම.

2.7 වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

2010 වර්ෂයට අදාලව වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර තිබුණද එහි පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය විය.

ව්‍යාපෘති තීරණය කිරීමේදී අධිකාරියේ සියලු අංශ සැලකිල්ලට ගෙන නොතිබුණි. ආයතනයේ අරමුණුවලට පරිබාහිරව ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර තිබූ අතර එම ඉලක්ක කරා ළගාවී නොතිබුණු අවස්ථාද නිරීක්ෂණය විය.

2.8 අයවැය ලේඛනය

අයවැය සහ තථ්‍ය අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වන බැවින් අයවැය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය කෙරේ.

3. පද්ධති හා පාලන

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයා වෙත වරින් වර දන්වා යවන ලදී. අධිකාරියේ විශේෂ අවධානය යොමු කළයුතු පද්ධති හා පාලන ක්ෂේත්‍ර පහත දැක්වේ.

(අ ) ස්ථාවර වත්කම්
(ආ) මිලට ගැනීම්
(ඇ) ගිණුම්කරණය
(ඈ) ණය මුදල් සහ ආදායම් රැස්කිරීම
(ඉ ) පැරණි ණයගැති සහ ණයහිමි ශේෂ
(ඊ ) කොන්ත්‍රාත් කටයුතු
(උ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
(ඌ) සේවක මණ්ඩල කළමනාකරණය